# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පුරප්පාඩු පිරවීම

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**1. සාමාන්‍යාධිකාරී HM 2 -1 "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" තනතුරු 01 කි**

**තනතුරට අදාළ සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) කළමනාකරණය, සිවිල් ඉංජිනේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**සමග**

කළමනාකරණය, ඉංජිනේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) හෝ වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ (SLIA) (Chartered Engineers/ Chartered Architects) සම්පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරු වල අවම වශයෙන් වසර විස්ස (20) ක පළපුරුද්ද ලබා තිබීම. අවම වශයෙන් මින් වසර 05ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුයි.

**හෝ**

(ආ) කළමනාකරණය, සිවිල් ඉංජින්නේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම,

**සමග**

කළමනාකරණය, ඉංජිනේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

**සහ**

ආචාර්ය උපාධියක් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 05ක අදාළ විෂය ක්ෂේත්‍රයහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සමග**

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාව.

**වැටුප**

HM 2 -1 - රු. 91,645 - 12 X 2,700= 124,045

- තෝරාගනු ලබන අයදුම්කරු ආරම්භක වැටුපෙහි (රු. 91,645) පිහිටුවනු ලැබේ.
- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- ඉන්ධන දීමනාව සමග නිලරථයක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් ලබනු ඇත.

**වයස**

වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**2. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්/ පරිපාලන) "කළමනාකාර" MM 1-1 තනතුරු 01 කි**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ (JM) අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප - MM 1-1- රු.53,175 - 10X1,375 - 15X1,910 = 95,575

- තෝරාගනු ලබන අයදුම්කරු ආරම්භක වැටුප වන රු.53,175.00 පිහිටුවනු ලැබේ.
- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දූරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙකුම,**

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ පොදු කොන්දේසි**

1. මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 12% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
2. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.
3. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
4. අධ්‍යාපන, වෘත්තීය සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
5. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය**

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කොට 2022.10.17 දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපහැදිලි, අසම්පූර්ණ අයදුම්පත් සහ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 02.**